# සිතීමේ නිදහසට එරෙහිව මානුෂීය ගුණාංග

ආගමක් මෙන්ම විශ්වාසයක් යනු මිනිසාගේ සිත මුලික කොටගෙන ඇති වන්නකි. යම්කිසි ආගමකට හෝ විශ්වාසයකට අදාළ ක්‍රියාවකට පෙර මානසික වශයෙන් මිනිසා එය හා බැඳී සිටිය යුතුය. එමනිසා ආගමක් හා විශ්වාසයක් යන පදයට සිතීමේ යන පදය ආදේශ කළේ එබැවිනි. ආගමක් යනු "Religio" යන ලතින් වචනය මුල්කොට ගෙන ඉංග්‍රීසි භාෂාවේ "Religion" යන පදය සකස් වී ඇති අතර දේවවාදී විශ්වාස කිරීමක්, නැතිනම් විශ්වාසයක් යනාදී අදහස් ගෙන දෙන්නකි. විශ්වාසයක් යනු යථාර්තයක් සත්‍ය වන බව පිළිගන්නා මානසික ආකල්පයකි. මිනිසාට තමා කැමති ඕනෑම ආගමක් අදහීමට, විශ්වාසයක් දැරීමට මානසික හා භෞතික වශයෙන් අයිතිය හැකියාවක් සහ නිදහසක් ඇත. එහෙත් වර්තමානයේ මිනිසා මෙම සිතීමේ නිදහස තමන්ගේ පෞද්ගලික ආගමක් හෝ මතයක් වර්ධනය කර ගැනීමේ අරමුණෙන් තමන්ගේ එම නිදහසට බාධා එල්ල කරනු දැකගත හැකිය. මීට එරෙහිව ආගමික හා විශ්වාසයේ නිදහස රැකීම උදෙසා මානුෂීය ගුණාංග වල අදාළත්වය ඉතා වැදගත් වේ.

රටේ පවතින ආගමික ජන සංඛ්‍යානය බැලුවිට මුළු ජනගහනය මිලියන 22.4 බව වාර්තා වේ (2017 ජූලි ඇස්තමේන්තුව). 2012 ජන සංගණනයට අනුව මුළු ජනගහනයෙන් 70.2% බෞද්ධ, 12.6% හින්දු, 9.7% මුස්ලිම්, 7.4 ක් ක්‍රිස්තියානි වේ. නමුදු මෙය අසමානතිය වශයෙන් ද විවිධත්වයක් ගනී. මෙම මත සහ කුළ වශයෙන් ඇති විභේදතාවය ද ආගමික ගැටුම් නිර්මාණය වීමට එයින් ආගමික හා විශ්වාස දැරීමේ ඇති නිදහස උල්ලංඝනය වීමට හේතුවේ. මත ආගම් සංස්කෘතික තමන්ගේ බලය පදනම් කොට ගනිමින් කුළ සංස්කෘතීන් දෙවැනි කොට සැලකීමෙන්, ඔවුන්ගේ අයිතිවාසිකම් කඩ කිරීමෙන්, අනෙක්

සුළු ආගමික සංස්කෘතීන් විසින් තම බලය පෙන්වීම ජීවිතය
අවමානයට විරුද්ධව කටයුතු කිරීමෙන් සිදු වේ. මෑත කාලීන
ලෝකය ගත් කළ බොහෝමයක් ආගමික ගැටුම් නිර්මාණය
වී ඇත්තේ නොඉවසිලිවන්තභාවයන්, තම ආගමට හෝ
මතයට පමණක් ලැදියාව දැක්වීමෙන් බව ඉන් මනාව
ගම්‍යමාන වෙයි. ඒ නිසා එක පෙළින් පවතින ආගමික
සාම්ප්‍රදායන්, විවිධ මතධාරීන් නිසා අද නානාප්‍රකාරයෙන් පවතින
උත්සුකම් සාමය නිසා ශ්‍රී ලංකාවේ ආගමික හෝ විශ්වා-
-සයේ නිදහසට ගරු කිරීම ශක්තිමත් කිරීමට බලධා-
-රීන් විසින් නිර්දේශය කොට ඇත්තේ.

ආගමික නිදහසට රජය මගින් දක්වන ගෞරවය
දැක්වූ විට එහි මේ ආකාරයට සඳහන් වේ. "ආණ්ඩුක්‍රම
ව්‍යවස්ථාවට අනුව සෑම පුද්ගලයකුටම තමන් කැමති
ආගමක් තෝරා ගැනීමේ අයිතිය ඇතුළුව සිතීමේ, හෘද
සාක්ෂියේ සහ ආගමික නිදහස ඇත. තවද ආණ්ඩුක්‍රම
ව්‍යවස්ථාවට අනුව පුරවැසියන්ට ඔවුන්ගේ ආගම හෝ ආගමික
විශ්වාසයන්, වත්පිළිවෙත්, ඉගැන්වීම් පුහුණුවේ හෝ
පෞද්ගලිකව ප්‍රකාශයට පත් කිරීමට අයිතිය ඇත."
යනුවෙන් සඳහන් කොට ඇත.

ශ්‍රී ලංකාව ගත්විට බොහෝ අවස්ථාවන් වලදී
බොහෝ ආගම්වල නිදහස් බවට බාධා වී ඇත. ඉහත කීවූ
ආකාරයටම මෙයට හේතු වී ඇති එක් කරුණක් වන්නේ
මිනිසුන් තුළ අද අභ්‍යන්තරයේ වර්ධනය විය යුතු උතුම් මානුෂීය
ගුණාංග වල මඳ බවයි. මෙය නිදසුන් මගින් පැහැදිලි කොට
ගත හැකිය. 2019 අප්‍රේල් 21 පාස්කු ඉරිදා ප්‍රහාරය
ශ්‍රී ලංකාවේ පල්ලි තුනක් සහ වාණිජ අගනුවර වන
කොළඹ සුඛෝපභෝගී හෝටල් සම්බන්ධීකරණය කොට එල්ල
කරන ලද බෝම්බ ප්‍රහාරය දී සහරාන් හාෂිම් විසින්
සටහන් කරන ලද වීඩියෝ පටයක සටහන් වී ඇත්තේ බව
මෙම ක්‍රියාව "අල්ලාහ් දෙවියන් වෙනුවෙන් තම මුස්ලිම්

RICHARD

දරුවට එමගින් ආදරය කිරීම සහ අල්ලාහ් දෙවියන් වෙනුවෙන් මුස්ලිම් නොවන අයට වෛර කිරීම " නිසා සිදු කරන ලද්දක් බවයි. මෙය එක් ගැටලුවක් පමණි. මෙහිදී මුස්ලිම් නොවන අන්‍ය ආගමිකයන්ට තමන්ගේ ආගම අදහ-මේ දී තිබෙන නිදහස සීමාවට ලක් කරයි. එයට බාධා කරයි. බොහෝ සැමවිටම මුස්ලිම්වරුන්ගේ සැකයට ලක්වෙති. පීඩාවට ලක් වෙති. එමෙන් මුස්ලිම්වරුන්ට තිබෙන අයිතියම එලෙසම අන්‍ය ආගමිකයන්ට ද ඇත. අන්‍ය ආගමිකයින් බොහෝමට වඩා ආගමික චාරිත්‍ර වාරිත්‍ර වලින් විශාලවූ විය හැකිය, නමුත් ඒ සියල්ල තමා විසින් ඉවසිය යුතුය. බොහෝමට බාධාවක් නොවිය යුතුය. අයට සතුටම නොවෙනුන ද අන්‍ය සෑම ආගමිකයෙකුටම තම ආගම පිළිබඳ වටිනාකම්, ආචාරධර්මයන්, ගෞරවයන් ඇත. එයට වටිනාකමක් ඔබ විසින් ද ලබා දිය යුතුය. එය උතුම් මානුෂීය ගුණාංගයකි. නැතිනම් සිදුවන්නේ අන්‍යතාවගේ ඇති ආගමික නිදහස උල්ලංඝනය වීමයි.

තවද සමහර පුද්ගලයින් බුදු පිළිම වලට හානි කිරීම සම්බන්ධයෙන් විමර්ශනයේ දී හෙළි වූයේ “ ශ්‍රී ලංකාව මුස්ලිම්වරුන්ගේ රටක් බවත්. සියල්ලන්ම ආගමට හැදිය යුතු බවත් , නැතිනම් “ජිස්යා” නැමැති බදු මුදල ගෙවීමට සිදුවන බවත් ” යන මතයන් අනුව ඔවුන් කටයුතු කළ බවයි. මෙමගින් තවදුරටත් ආගමික නිදහස මුළුමනින්ම උදුරා දමයි. මුළු රටක් එක් ආගමකට සීමා කිරීම තුළ අනෙක් ආගමිකයන්ට තම ආගම අදහීමේ නිදහස නැති වී යයි. තවද ආගම ඇදහීම උදෙසා බදු මුදල් ගෙවීමට සිදුවීම තම ආගමට මුදලින් තක්සේරු වැනිය. මෙහිදී විශාලත්වය වශයෙන් විශ්වාසයන් අතර මානුෂීය ප්‍රභාගය වර්ධනය කර ගන්නවයි. සෑම මිනිසෙකුටම නිදහසේ තම ආගම තුළ හැසිරිය හැකි බව විශ්වාස කළ යුතුයි. සමාජීයත්වය රැකිය යුතුය. අනෙකාගේ නිදහසට ගරු කළ යුතුයි. එවිටයි එකිනෙකාගේ මිනිසේ නිදහස රැකෙනුයේ. තවද වහාබ් මුස්ලිම් ආගම් ගොඩනඟා ගනිමින් මෙවැනි කිසිදු හරයක් නොමැති අදහස් ප්‍රකාශ කිරීම තුළ සිදුවන්නේ මුස්ලිම්ය ආගමේ පවතින පිරිසිදු බවට , අභිමානවත්වයට , ගරුත්වයට හානි පමිණීමයි.

එසා ගොඩ වන්නේ යටගතුවේ ආගමන් ගේ විශ්වාසයන් පිළිබඳව නිදහස ඇතිම සඳහා මානුෂීය ගුණාංග සමාජයේ ගමන් කිරීමයි. ආගමික සහජීවනය ගොඩනැගෙන්නේ එවිටය. සහජීවනය යනු සාමයත්, සමගියත්, සහයෝගයත් ඒවන් වේයි. එකමුතුතාවයයි. මෙය මිනිස් සමාජයේ තිබිය යුතු එක් උසස් ගුණාංගයක් ද වේ. සෑම දෙයකටම සමගියෙන් හා සතුටින්, විවාද නොකර කිරි හා ජලය මෙන් එකිනෙකා පැවතීමයි. මෙහිදී අප ගරු කළ යුතු ආගමික ස්ථාන වලට ගරු කිරීම, ගරු කළ යුතු ආගමික නායකයන් වැනි පුද්ගලයන්ට ගරු කිරීමයි. කව ද වෙනත් ආගම් වල ඇති අදහස්, චාරිත්‍ර චාරිත්‍ර වලට එරෙහි නොවීමයි. ඒවා සඳහා හැකි පමණින් සහය වෙමු. ඒවාට ගරු කරමු. ඒවා අතුරින් තමාගේ ආගමේ පිළිවෙත් වලට යම් ප්‍රමිතියක් වන්නේ නම් ඒවා ගෞරවනීයත්වයත් හා උපදේශයත් බොහෝ දුර ගනී. අපගේ ආගම පෙනුමෙන් අපට ආසන්න නොවෙනමුත් අවශ්‍යතාවයන් ද නිදහසක් ද අවකාශය ද එම ප්‍රමාණයේ අවශ්‍යතාවයන්,

නිදහසට බිඳීම් යන්න ඔබ නඩාවගන කටයුතු කරයි.

මෙරටේ ආගමික නිදහස සුරැකීමෙන් ආගමික සමගිය නිරාශාවයන් ලැබේ. එමෙන් ම අප සියලු ආගම් අදහීම තොරවම් යන්න වේ. තවද සෑම ආගමකින්ම උගන්වන්නේ මිනිසාගේ යහපත වන නිසා සෑම ආගමකින්ම එකම දෙය කියවේ යන වැරදි මතයට ඇවිරිමට කොටවේ. අනෙක් ආගමිකයන්ට එම කටයුතු මගට පිළිපදිමට ඉඩ සලසා දී එයට බාධා නොකරමින් තමාගේ ආගමික කටයුතු ද මනා ලෙස පිළිපදියි. එවිට අනිකාගේ මෙන්ම තමාගේ ද ආගම් නිදහස සුරක්ෂිත වන්නේය. මෙහි දී වාදගම් කාර්යභාව වන්නේ සමගිය, සමාදානය, සහජීවනය ඇතිම ශක්තිමත් ආගමික නිදහස හෝ වේ විශ්වාසයන් පිළිබඳ නිදහස රැකීමයි. ආගමික හෝ විශ්වාසය පිළිබඳ නිදහස මානුෂීය ගුණාංග මගින් වර්ධනය කරන අතරතුර මෙහි ප්‍රවෘත්තියන් ලෙස තොරතුරු කරනා පිරිය කම ආගමෙහි සිට අනෙක් ආගම් හා සමාජශීලි භාවයන්, එකමුතුව ක්‍රියා කරන අයුරු දැකගත හැකිය. BBC පුවත් වෙබ්අඩවියෙහි කිහිපයක් දැක්වීම් කිහිපයක් මෙසේය. “ශාන්ත මේරි තුර්ති - බෞද්ධ සිකුරාද ආදිත මුස්ලිම් ගුවනිය” (පළ වූ දිනය 2019 සැප්. 9), “බුදු දහම පිළිබඳ පළමු ශ්‍රී ලාංකික එජිශාන් උපාධිධරයා - රොරහාමිඩ් අසාත්” (පළ වූ දි. 2018 සැප්. 7), “මුස්ලිම් අධිකාරයන්ගේ රාමසාන් උත්සවය බෞද්ධ මෙන්ම හින්දු භක්තිකයන් ද සහභාගිවිය” (පළ වූ දි. 2015 ජූලි 05).

මේ ආකාරයට ආගමක් හෝ විශ්වාසයක් දැරීමට ඇති නිදහස වෙනුවෙන් සතර දිම, සහයෝගිතාව, ඉවසීම, සමානාත්මතාව යනාදී මානුෂීය ගුණාංග ඉගෙනුම් වන බව පවසිය හැකිය. තවද බිය, සැකය, අවිශ්වාසය වැනි තමාගේ ආගමික නිදහස රැක ගැනීම උදෙසා රට තුළ සාමය, ඉවසීම, සහයෝගය යන මානුෂීය ගුණාංග වලට සෑම අයෙකුටම අනුවර්තනය වීමට හැකිනම් එය ඉතා අගනේය.

(වචන 836)

රණවීර මල්ෂා චතුභාෂිණී.

malshachathubhashini@gmail.com.

200081600029

20 - 09 - 29